ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 896/2 – 1995 නොවැම්බර් 07 වැනි අඟහරුවාදා – 1995.11.07
896/2 ஆம் இலக்கம் – 1995 ஆம் ஆண்டு நவெம்பர் மாதம் 07 ஆம் திகதி செவ்வாய்க்கிழமை
No. 896/2 – TUESDAY, NOVEMBER 07, 1995

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 47(1) වගන්තිය සමඟ කියවිය යුතු 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1995 නොවැම්බර් මස 03 වන දින,
කොළඹ දී ය.

### නියමාවලිය

1. මේ නියමාවලිය 1995 අංක 3 දරන මණ්ඩප සභා නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු එය ක්‍රියාත්මක විය යුතු ය.

2. (1) (මෙහි මින්මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) මණ්ඩප සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය

(අ) මණ්ඩපයේ මණ්ඩපාධිපතිවරයා ;

(ආ) මණ්ඩපයේ එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(ඇ) මණ්ඩපයේ එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයා ;

(ඈ) මණ්ඩපය අනුබද්ධිත විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින්, එහි සාමාජිකයන් අතුරෙන් තෝරා ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ; සහ

(ඉ) මණ්ඩපය අනුබද්ධිත විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් මණ්ඩපයේ විවිධ අධ්‍යයන විෂයයන් සම්බන්ධයෙන් විශිෂ්ට සේවාවක් කරනු ලැබූ තැනැත්තන් අතුරෙන් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්.

(2) 2 වන ජේදයේ (ඈ) අනු ජේදය යටතේ තෝරා පත් කර ගනු ලැබූ හෝ 2 වන ජේදයේ (ඉ) අනු ජේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු, ඔහු කලින් ධූරය අත්හැර ගියහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, ඔහු තෝරා පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ දින සිට තුන් වසරක කාලයක් ධූරය දැරිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි නැවත තෝරා පත් කරනු ලැබීමට හෝ නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙකු විය හැකි ය.

එසේ වුව ද, තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයකු තමා මණ්ඩපයේ සාමාජිකයකු වශයෙන් තෝරා පත් කර ගැනීමට සුදුසුකම් ලැබූ, විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සාමාජිකයකු වශයෙන් සිටින තාක් කල් ධූරය දැරිය යුතු ය.

(3) යම් පත් කරනු ලැබූ හෝ තෝරා ගනු ලැබූ සාමාජිකයකු ධූර කාලය ඉකුත් වීමට පෙර තම ධූරය අත්හැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා, ඔහු කලින් ධූරය අත්හැර ගියහොත් මිස, තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කොටස සඳහා ධූරය දැරිය යුතු ය.

(4) මණ්ඩපය අනුබද්ධිත විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සභාවේ පත් කරනු ලැබූ හෝ තෝරා පත්කරනු ලැබූ යම් සාමාජිකයකුට තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) සභාවේ යම් රැස්වීමක ගණපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(6) මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා සභාවේ සියලු ම රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. යම් රැස්වීමක මූලසුන දැරීමට මණ්ඩපාධිපතිවරයාට නො හැකි වන අවස්ථාවක, සාමාජිකයන් විසින්, පැමිණ සිටින තැනැත්තන් අතුරෙන් යම් සාමාජිකයකු ඒ රැස්වීමෙහි මූලසුන දැරීමට තෝරා ගනු ලැබිය යුතු ය.

3. 1979 සැප්තැම්බර් මස 28 වන දින අංක 55/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1979 අංක 3 දරන මණ්ඩප සභා නියමාවලිය මෙයින් ඉවත් කරනු ලැබේ.